# කුරුවිට අධ්‍යාපන කොට්ඨාසය
# Kuruwita Educational Division

දෙවන වාර පරීක්ෂණය - 2019 | 10 ශ්‍රේණිය
**Second Term Test - 2019** | **Grade 10**

සිංහල I
**Sinhala I**

පැය එකයි
**1 hour**

සැකසුම - **ර/පොහොරබාව මහා විද්‍යාලය**

නම :...........................................................................................................................................................

උපදෙස් :- **(i)** **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තොරන්න.**
**(ii)** **මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 හිමි වේ.**

- **අංක (01) සිට (04) තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.**

**01** හිත මිතුරන්ගේ **කෙනෙහිලිකම්** සිරිදාසගේ දියුණුවට හේතු වූ බව තතු දන්නෝ පවසති.

**(1)** දැඩි හිතවත්කම් **(2)** සිත් රිදවන හැසිරීම් **(3)** මඟ පෙන්වීම් **(4)** බල කිරීම්

**02** ගංවතුරට හසු වී තමන්ගේ **මුළු සේසතම** විනාශ වූ බව ගොවීහු ප්‍රකාශ කරති.

**(1)** තමාට අයිති සම්පූර්ණ දේපළ **(2)** වී ගබඩාව
**(3)** වැඩිපුර භාණ්ඩ **(4)** සම්පූර්ණ කුඹුරුයාය

**03.** අවසාන වටය සඳහා **කරට කර හරියන** ක්‍රීඩකයෝ දෙදෙනෙක් ඉදිරිපත් වූහ.

**(1)** ප්‍රතිවිරුද්ධ **(2)** සමාන දක්ෂතා ඇති **(3)** පස මිතුරන් වූ **(4)** ජයග්‍රහනලාභී

**04.** නොනිසි තනතුරක් ලැබීමත් සමඟ ඔහුගේ **ඔළුව ඉදිමී ඇති** බව සෙස්සෝ පැවසූහ.

**(1)** හිසෙහි රෝගයක් සෑදී **(2)** තනතුරෙන් උසස් වී
**(3)** අහංකාරයට පත් වී **(4)** හිස අවුල් වී

- **අංක 05 සිට 07 තෙක් වාක්‍ය වල හිස්තැනට වඩාත්ම සුදුසු පදය තෝරන්න**

**05.** මහ වැසි ඇද හැලීමෙන් ජලාශයෝ පිරී ඉතිරී...........

**(1)** යයි **(2)** ගියේ ය **(3)** ගියා ය **(4)** ගියෝ ය

**06.** ගායකයා ගී ගයද්දී ඇතැමෙක් අත්පොළසන්.............

**(1)** දෙති. **(2)** දුන්නේ ය. **(3)** දුන්නා ය. **(4)** දෙයි.

**07.** ලේඛකයා විසින් දේශපාලඥයෝ විවේචනය.............

**(1)** කරයි. **(2)** කරන්නී ය. **(3)** කෙරෙති. **(4)** කරනු ලබයි.

➢ **සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.**

**08.** **(1)** නිෂ්පාදන, සමස්ථ, ප්‍රස්ථාර, අර්බුදය **(2)** ශිෂ්ටාචාරය, ප්‍රස්තා පිරුළු, දර්ශනය, සංකීර්ණ

**(3)** පුස්ථකාලය, විශිෂ්ට, ලේකම්, සම්ප්‍රධාය **(4)** කළමණාකරු, ප්‍රශ්ණ, ඓතිහාසික, මධ්‍යස්ථානය,

**09.** **(1)** ඥානය, වාක්‍යාර්ථය, ධෛර්‍යය, ඖෂධ **(2)** පිළිසඳර, ගනුදෙනු, බහුශ්‍රැත, වර්ධනය

**(3)** පරිවර්ථනය, සංවර්ධනය, ශාස්ත්‍ර. යථාර්ථය **(4)** අනුශාසනා, කථනය, රස නිෂ්පත්තිය, ශබ්ද

**10.** "සිංහලයිනි <u>නැගිටිව්</u>" මෙහි ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය වනුයේ,

**(1)** පූර්ව ක්‍රියා **(2)** අසම්භාව්‍ය ක්‍රියා **(3)** විධි ක්‍රියා **(4)** මිශ්‍ර ක්‍රියා

**11.** අම්මා දරුවා දෙස <u>ආදරයෙන්</u> බැලුවාය. යන වැකියේ "ආදරයෙන්" යනු,

**(1)** නාම විශේෂණයකි **(2)** උපසර්ග පදයකි **(3)** ක්‍රියා විශේෂණයකි **(4)** කෘදන්ත ක්‍රියා පදයකි

➢ **අංක** 12 **සිට** 13 **ප්‍රශ්න වල තද කළු අකුරින් මුද්‍රිත යෙදුම් සඳහා වඩාත් සුදුසු තනි පදය තෝරන්න.**

**12.** සද්ධර්මරත්නාවලී කතුවරයා **බොහෝ ඇසූ පිරූ තැන් ඇති** යතිවරයෙකි.

**(1)** බුද්ධිමත් **(2)** බහුශ්‍රැත **(3)** උගත් **(4)** නුවණැති

**13. රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව** නැති අය පරෙස්සම් වීම අත්‍යාවශ්‍ය වූවකි.

**(1)** ප්‍රතිජීවනය **(2)** ප්‍රතිනිර්මාණය **(3)** ප්‍රතිශක්තිය **(4)** ප්‍රතිචක්‍රීකරණය

➢ **14 සිට 15 දක්වා ප්‍රශ්නවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය නිවැරදිව ඇති පිළිතුර තෝරන්න.**

**14.** මිනිසා

**(1)** මිනි + ආ **(2)** මිනිස් + ආ **(3)** මිනිසි + ආ **(4)** මිනි + ස් + ආ

**15.** ලියයි

**(1)** ලිය + යයි **(2)** ලියා + ආ **(3)** ලිය + යි **(4)** ලියු + යි

➢ **මුලින් දී ඇති පදයට සමාන පදයක් නොමැති වරණය තෝරන්න.**

**16.** **(1)** කාන්තාව - ඉතිරිය, මියුලැසි, දිගැසි **(2)** ඇස - ලෝචන, නෙත්, නුවන්

**(3)** හිරු - දිනපති, රිවි, දිනිදු **(4)** කුරුළු - සකුණ, බාසුරු, සියොත්

**1 7.** **(1)** දිය - ජලය, පැන්, අඹ **(2)** මුහුද - රුවනාර, සමුදුර, දලනිදු

**(3)** නෙළුම් - තඹර, පද්ම, කුසුම් **(4)** අහස - ගුවන, අඹර, නබෝගැබ

➢ **මුලින් දී ඇති පදයට විරුද්ධ පදයක් දී ඇති වරණය තෝරන්න.**

**18.** **(1)** පියා - පියාණ, පිය, පීතෘ **(2)** චන්ද්‍ර - නිශාකර, සිසි, තරිඳු

**(3)** චංචල - චල, නිශ්චල, සචල **(4)** නාදය - රාවය, රැව්, නද

**19.** **(1)** ප්‍රසිද්ධ - පුවතර, ප්‍රකට, පතල **(2)** රජ - භූපති, නර, මීපල්

**(3)** ජංගම - තිරසාර, ස්ථාවර, විකල්ප **(4)** ආවරණ - අනවසර, අනාවරණ, අනාතන

➢ **අංක** 20 **සිට** 21 **දක්වා ඇති ප්‍රස්තාව පිරුළ සඳහා වඩාත් ගැලපෙන අදහස තෝරන්න.**

**20.** ''ඇවිද්ද පය දහස් වටී''

**(1)** දේශාටනය බොහෝ වැදගත්. **(2)** ඇවිදීම පයට යහපත් වේ.

**(3)** ඇවිදීමෙන් ආබාධ දුරු වී. **(4)** දෙපය දහස් ගණන් වටී.

**21.** "කඩු ගත්තෝ කඩුවෙන්ම නසිති."

**(1)** යුද්ධයට කඩුව අවශ්‍ය වේ. **(2)** යුද්ධයට යන්නෝ ආයුධයෙන් ම නසිති.

**(3)** කඩුවෙන් තොර යුද්ධයක් නැත. **(4)** යුධයට කඩුව නිෂ්ඵල වූවකි.

➢ 22 **සිට** 23 **ප්‍රශ්න වල එක් එක් පද යුගලයෙහි සම්බන්ධය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

**22.** **උදව්-පදව්**

**(1)** වෙනස් **(2)** වැඩි **(3)** සමාන **(4)** විරුද්ධ

**23.** **අය-වැය**

**(1)** සමාන **(2)** විරුද්ධ **(3)** වෙනස් **(4)** වැඩි

➢ 24 **හා** 25 **ප්‍රශ්න වල දී ඇති පදයේ අර්ථය නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.**

**24.** දේශානුරාගය යනු,

**(1)** මාතෘභූමියට ඇති ගරුත්වයයි. **(2)** මාතෘභූමියේ නිදහස් නිවහල් බවයි.

**(3)** මාතෘභූමිය කෙරෙහි ඇති ඇල්මයි. **(4)** මාතෘභූමියේ උදාරත්වයයි.

**25.** ප්‍රතිභාව,

**(1)** වස්තූන් තෝරා බේරා ගැනීමේ හැකියාව. **(2)** යමක් නැවත නැවත ලිවීමේ හැකියාව.

**(3)** භාවයන් උචිත පරිදි යෙදීම. **(4)** අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ හැකියාව.

**26.** අක්ෂර උත්පත්ති ස්ථානයක් නොවන්නේ,

**(1)** දිව මුදුන **(2)** තොල් **(3)** තල්ල **(4)** උගුර මැද

**27.** සඤ්ඤක අක්ෂර දෙකක් යෙදී ඇති වරණය තෝරන්න,

**(1)** සෞඛ්‍යය, සුවඳ **(2)** සොඬ, හඳ **(3)** ලඹය, වඳ **(4)** මර්දනය, ලේඛණය

**28.** ඌෂ්මාක්ෂර පමණක් යෙදී ඇති වරණය තෝරන්න,

**(1)** ස,ෂ,ශ,හ **(2)** ෆ,ෂ,ස,ළ **(3)** (අ)ඃ,ක,ෂ,ද **(4)** ක,හ,ෂ,ග

**29.** වර්ගාක්ෂර ප්‍රභේද ගණන වන්නේ,

**(1)** 6යි **(2)** 5යි **(3)** 4යි **(4)** 25යි

**30.** ''අර්ධස්වර'' යනුවෙන් හඳුන්වන්නේ,

**(1)** ඌෂ්මාක්ෂර **(2)** ඝෝෂාක්ෂර **(3)** සඤ්ඤක අක්ෂර **(4)** අන්තඃස්ථාක්ෂර

**31.** කරප, බලප, බීප, යනුවෙන් ව්‍යවහාර කරන්නේ,

**(1)** මොණරාගල **(2)** බලංගොඩ **(3)** බදුල්ල **(4)** ගාල්ල

**32.** "අම්මණ්ඩි" යන පදයෙන් හැඳින්වෙන්නේ,

**(1)** අම්මා **(2)** අත්තම්මා **(3)** නැන්දා **(4)** ගැහැනිය

**33.** විශේෂණ පද දෙකක් ඇතුළත් වරණය තෝරන්න,

**(1)** වන මල් පියලි සලා. **(2)** පුංචි කුඩුවක කැළයේ.

**(3)** දුක් දෙන අලි ඇතුන්. **(4)** ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ.

**34.** කවියක එකම පදය නැවත නැවත යෙදීම,

**(1)** පුනරුක්තිය **(2)** එළිසමය **(3)** රූපකයකි **(4)** අනුප්‍රාසයකි

**35.** ''නෙත නිලුපුල්'' මෙහි ඇත්තේ,

**(1)** උපාවකි **(2)** එළිසමය **(3)** රූපක **(4)** උත්ප්‍රාසයකි

**36.** වේදිකා නාට්‍ය කලාව සම්බන්ධයෙන් අදාළ නොවන ප්‍රකාශය වන්නේ,

**(1)** නාට්‍ය කලාව සජීව කලාවකි. **(2)** ඕනම අවස්ථාවක නැරඹීමට හැකි කලා මාධ්‍යකි.

**(3)** කලා මාධ්‍යයන් කිහිපයක එකතුවකි. **(4)** නාට්‍ය කලාව සාමූහික කලා මාධ්‍යකි

➢ 37 **සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති වාක්‍ය අතුරින් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.**

**37.** **(1)** අශෝක රජතුමා දැහැමි පාලකයෙක් ලු. **(2)** අපි නීති ගරුක පුරවැසියෝ

**(3)** ඕ තොමෝ ගමට ගියහ. **(4)** පයින් යන්නෝ පාරේ දකුණු පසින් යා යුතු ය.

**38.** **(1)** අප ගිලනුන්ට උවටැන් කරමු. **(2)** සොරු දෙදෙනෙක් අත් අඩංගුවට පත් වූහ.

**(3)** සභාතොමෝ සතුටින් විසිර ගියහ. **(4)** ළමයා විසින් පොත් කියවති.

**39.** **(1)** නුඹ හොඳින් ඉගෙන ගත්තෙහු. **(2)** ස්වාමීන් වහන්සේ දම් දෙසයි.

**(3)** තාරකා අහසේ බබළයි. **(4)** ඇතැමෙක් නිකරුණේ කාළය ගත කරයි.

**40.** **(1)** සියොත් කැළ අහසේ සැරි සරති. **(2)** ක්‍රීඩා කණ්ඩායමෙන් එක්කෙනෙක් ඉල්ලා අස් වෙති.

**(3)** පියාණෝ අපට ඔවදන් දෙයි. **(4)** ගස්හු සුළඟට සෙලවෙයි.